

දැයට කිරුළ 2011ට සමගාමීව පැවති සංවර්ධන සතියේදී ඌව වෙල්ලස්සට FPA ශ්‍රී ලංකා සම්ප්‍රාප්තිය . . .

SRI LANKA
enriching relationships

# පුවත් සංග්‍රහය

2010 දෙවන කලාපය

www.fpasrilanka.org

## සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...

# අභියෝග ජයගැනීමට ජනගහනය නිසි ලෙස කළමනාකරණය විය යුතුයි.

### සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා



**ඡායාරූපයේ වමේ සිට:** FPA ශ්‍රී ලංකා විධායක අධ්‍යක්ෂ ගාමිණී වනසේකර මහතා, සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා, අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා, කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිනි මහාචාර්ය ක්ෂාණිකා හිරුඹුරේගම මහත්මිය ඇතුලු පිරිස ලෝක ජනගහන දින උත්සවයට සහභාගි වෙමින්....

රටක ජනගහනය නිසි ලෙස කළමනාකරණය කිරීම, විවිධ අභියෝග ගැටලු ජය ගැනීම සඳහා විශේෂයෙන්ම අවශ්‍ය වන්නක් බව සෞඛ්‍ය අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා ලෝක ජනගහන දිනය නිමිත්තෙන් FPA ශ්‍රී ලංකා ආයතනය සංවිධානය කළ උත්සවයේදී ප්‍රකාශ කළේය.

මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා විසින් රචිත "ශ්‍රී ලංකාවේ ජනගහනය: ඉහළ යන සඵලතාව සහ ඉදිරි සංවර්ධන අභියෝග"ග්‍රන්ථය දෙරට වැඩුම මෙහිදී සිදුවිය.

තවදුරටත් සභාව ඇමතූ අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා, "චීනය, ඉන්දියාව වැනි රටවල් ජනගහනය කළමනාකරණය කරන්නෙ දේශපාලන ක්‍රමයක් සමගය. ලෝකයේ සමහර රටවල් ආගමික පසුබිමෙන් ජනගහනය කළමනාකරණය කරනවා. ශ්‍රී ලංකාවේත් ජනගහනය කළමනාකරණය කරන්නේ දේශපාලන ක්‍රමයක් සමගය. අපේ රටේ ජනගහනය සංවර්ධනයට, පවුල් සංස්ථාව සංවර්ධනය, අධ්‍යාපනයට බලපාන ජනගහන වර්ධනයේ බලපෑම, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අභියෝග-ප්‍රශ්න , මේ සියල්ල සමග නව

2 පිටුවට...

## ඉහළ ප්‍රතිචාර . . .

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ජනතා අවධානයත්, අවබෝධයත් තවදුරටත් මැනවින් ඇති කළ යුතු කාල වකවානුවකි මේ. මෙහිදී දේශපාලන නායකත්වයන් මෙන්ම, රාජ්‍ය නිලධාරීන්, තීරණ ගන්නන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ දායකත්වය අත්‍යවශ්‍ය වන්නේය.

රටේ සෑම තරාතිරකම පිරිස ඒ ඒ වයස් මට්ටම අනුව ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීම, ලිංගික අපචාර, අනපේක්ෂිත ගැබ් ගැනීම්, අනාරක්ෂිත ගබ්සා, අඩුවයස් විවාහ, අඩුවයස් ගැබ්ගැනීම්, මාතෘ මරණ, මේ සියල්ල අවම කිරීමට බලපානු ඇත.

පසුගිය අගෝස්තු මාසයේ සිට ජාතික මට්ටමෙන් ප්‍රතිපත්තිමය වෙනසක් සඳහා ඌව වෙල්ලස්සෙන් අපි අපගේ වැඩසටහන් ආරම්භ කළෙමු. ඉහළ ප්‍රතිචාර ඊට ලැබුණු අතර අප ශක්තිමත් කිරීමට එය රුකුලක් විය.

අපගේ Happy Life ව්‍යාපෘතිය යටතේ දුරකථනයෙන් (2 588 488) වෙබ් අඩවියෙන් ප්‍රජනක සෞඛ්‍ය උපදෙස් ලබාගන්නා පිරිසද දවසින් දවස වැඩිවේ.

කොළඹ බුලර්ස් පටුමගේ FPA ශ්‍රී ලංකා ප්‍රධාන කාර්යාලයෙන් තොරතුරු ලබාගැනීමටද විශාල උනන්දුවකින් තරුණ-වැඩිහිටි පිරිස් පැමිණෙති.

මේ වනවිට ජනමාධ්‍ය ආයතන කිහිපයක්ද ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ කාර්යයට උරදීමට අපගේ මගපෙන්වීම ලබාගනිමින් සිටී.

රටේ ජනතාවගේ ජීවිත පරපුරෙන් පරපුරට වඩාත් සෞඛ්‍ය සම්පන්න කිරීමට අප ගනු ලබන උත්සාහයට ලැබෙන මෙම ප්‍රතිචාර අපි අගය කරමු.

## රණවිරුවන් සඳහා .........

# Light to Life ව්‍යාපෘතිය



FPA ශ්‍රී ලංකා විධායක අධ්‍යක්ෂ ගාමිණී වනසේකර මහතා ශ්‍රී ලංකා යුධ හමුදාපතිතුමන් හමුවූ අවස්ථාව. මෙම අවස්ථාවට FPA ශ්‍රී ලංකා නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂක ලසන්ත ගුණරත්න මහතාද, ව්‍යාපෘති සම්බන්ධීකාරක සුනිතා රත්නායක මහත්මිය ද සහභාගී වූහ.

## හමුදා රෙජිමේන්තු ගණනාවක වැඩමුළු

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව රණවිරුවන් දැනුවත් කිරීම සඳහා ක්‍රියාත්මක වන **"ජීවිතයට ආලෝකයක්"** (Light to Life) ව්‍යාපෘතිය යටතේ වැඩමුළු 10කට අධික ප්‍රමාණයක් පසුගිය මාස කිහිපය තුළ සංවිධානය කර තිබුණි.

පනාගොඩ, බෝයගනේ, අඹේපුස්ස, සේනපුර. කුරුවිට, සීදුව, මට්ටක්කුලිය යන ස්ථානයන්හි පිහිටි හමුද කඳවුරුවල රෙජිමේන්තු සඳහා මෙම වැඩමුළු සංවිධානය කෙරුණි.

මීට අමතරව යුධහමුද සේවා වනිතා ඒකකයේ විශේෂ ඉල්ලීම මත රාගම රණවිරු සෙවනේ නේවාසික රණවිරුවන් සඳහා දැනුවත් කිරීමේ සහ උපදේශන සේවා ලබාදීමේ වැඩසටහන් පවත්වන ලදි.

## වසංගත රෝග පිළිබඳ ජාත්‍යන්තර සමුළුව




වසංගත රෝග පිළිබඳ අග්නිදිග ආසියානු කලාපයේ 10 වෙනි සමුළුව කොළඹ දී පැවති අවස්ථාව. ඡායාරූපයේ වමේ සිට FPA ශ්‍රී ලංකා වෛද්‍ය අධ්‍යක්ෂිකා වෛද්‍ය සුමිත්‍රා තිසේරා මහත්මිය, එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත ලිනේ ක්‍රිස්ටියන්සෙන් මහත්මිය, FPA ශ්‍රී ලංකා ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, වෛද්‍ය ලලනි සී. රාජපක්ෂ මහත්මිය, වෛද්‍ය ලසන්ත මලවිගේ මහතා සැසිවාරයකට සහභාගි වෙමින්....

... 1 පිටුවෙන්

**අභියෝග ජයගැනීමට ජනගහනය....**

තාක්‍ෂණ ලෝකය අපට කොතෙක් දුරට කළමනාකරණය කරන්නේද යන ගැටලුව පවතිනවා.

අපේ වගකීම, අපේ ගුණාත්මකභාවය, අපේ යහපත්කම්, අපේ මනුෂ්‍යත්වය, අපේ හැදියාවල් මේ සියලු කරුණු සඳහා ලෝකයේ ජීවත්වන මිනිසුන් තුළ තිබිය යුතු මිනිස්කම පිළිබඳව අභියෝග ජයගැනීමේ කාර්යය අපිට කළ හැකිවන්නේ ඉතා පැහැදිලි ලෙසම ජනගහනය නිසිලෙස කළමනාකරණය කිරීම මඟිනි." අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා ඇතුළු විද්වතුන් පිරිසක් සභාව ඇමතූහ.



## අධිවාචනය (Advocacy) හඳුන්වාදීමේ වැඩසටහන

ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ජනතා අවධානය යොමුකිරීම සඳහා තීරණ ගන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු වගකිව යුත්තන්ගේ අවධානය සහ ක්‍රියාත්මකභාවය ඇති කිරීම සඳහා "අධිවාචනය" පිළිබඳව FPA ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් FPA ශ්‍රී ලංකා ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. මෙම අවස්ථාවට සහභාගිවූ **මුදල් අමාත්‍යාංශයේ සැලසුම් අධ්‍යක්ෂ එච්. එම්. ගුණසේකර මහතා** සභාව අමතන අවස්ථාව. අධිවාචන ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මියද ඡායාරූපයේ වේ.

# සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ අභිබවායන්නට අප ක්‍රියාත්මක විය යුතුයි!



ප්‍රසව සහ නාරිවේද
විශේෂඥ වෛද්‍ය **අතුල කළුආරච්චි** මහතා
FPA ශ්‍රී ලංකා - ගරු වෛද්‍ය අධ්‍යක්ෂ

**"ශ්‍රී ලංකාවේ මාතෘ මරණ සහ ළදරු මරණ අනුපාත දෙස බලනවිට අප බොහෝවිට ප්‍රකාශ කර සිටින්නේ දකුණු ආසියා කලාපය තුළ අප ඉතා හොඳ තැනක සිටින බවයි. එසේම සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථ සලකා බැලීමේදී ඇතැම් අභිමතාර්ථ අප ජයගෙන සිටින බවයි. බොහෝ දෙනෙකු සිතා සිටින්නේ. එසේ අප සිතුවත් තවමත් මේ රටේ මාතෘමරණ සිදුවනවා. මෙහිදී විශේෂයෙන් සැලකිය යුතුවන්නේ මේ බොහොමයක් මාතෘ මරණ වළක්වාගත හැකි තත්ත්වයේ ඒවා වීමය. මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට නම් සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථ වලින් ඔබ්බට ගිය ඉලක්ක අපට තිබිය යුතුය යන්න මගේ අදහසයි."**

අපේ රටේ සිදුවන මාතෘමරණ දිහා බලන විට **රක්තපාතය** නිසා, **අධික රුධිර පීඩනය** නිසා, **නීති විරෝධී අනාරක්ෂිත ගබ්සා** නිසා විවිධ සෞඛ්‍ය හේතුමත ගර්භනී නොවිය යුතු කාන්තාවන් ගර්භනීවීම නිසා ආදී වශයෙන් විවිධ හේතුමත මෙම මරණ සිදු වෙයි.

මෙහිදී තවත් විශේෂයෙන් පෙනෙන කරුණක් වන්නේ, ගර්භනීභාවයට එක එල්ලේම සම්බන්ධතාවක් නොපවතින හේතු මත (Indirect causes of maternal death) ගර්භනී මව්වරුන්ගේ සිදුවන මරණ සංඛ්‍යාව සලකා බලනවිට ඉන් වැඩි දෙනෙකුගේ මරණ සිදුවී ඇත්තේ හෘදයාබාධ නිසාය.

## හෘද රෝග

හෘද රෝග සහිත කාන්තාවන්, එම හෘදරෝග පවතින, ගැබ්ගැනීමකට නුසුදුසු අවස්ථාවක ගැබ්ගැනීම නිසා බොහෝවිට මෙම මරණ සිදුවී තිබේ. මෙම තත්ත්වය වළක්වා ගැනීමට විශේෂයෙන්ම අවධානය යොමුකළ යුතුයි. කාන්තාවන් ගර්භනීවීමට පෙර දැනුමක්-අධ්‍යාපනයක් ලබාදීම (Pre-Pregnancy Counselling) අවශ්‍යවනවා.

## අනපේක්ෂිත ගැබ්ගැනීම්

අනපේක්ෂිත ගැබ්ගැනීම් වළක්වා ගැනීම සඳහා පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ වඩ වඩාත් ජනතාව දැනුවත් කිරීම ඉතාම අත්‍යවශ්‍ය කාරණයක්. FPA ශ්‍රී ලංකා ආයතනයටත් මේ සඳහා සුවිශේෂ කාර්යභාරයක්, වගකීමක් ඉටුකිරීමට පැවරී තිබේ. පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව විධිමත් අධ්‍යාපනයක්, නූතන ක්‍රම පිළිබඳව ඒවායේ වාසි පිළිබඳව මේ ආදී වශයෙන් දැනුවත් කිරීම අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තක්.

## අනාරක්ෂිත ගබ්සා

අනාරක්ෂිත ගබ්සා කිරීම්වලින් ඇතිවන අතුරු ඵල පිළිබඳවද බොහෝවිට එවැනි අවස්ථාවල සිදුවන මරණ, එමෙන්ම ඒ මගින් ඇතිවිය හැකි වෙනත් රෝගී තත්ත්ව පිළිබඳව ජනතාව තවදුරටත් දැනුවත් කිරීම ඉතා වැදගත්.

## සියදිවි නසාගැනීම

ගර්භනී මව්වරුන්ගේ මරණ පිළිබඳ සොයා බලනවිට අප බොහෝ දෙනෙක් නොදකින පැත්තක් තිබෙනවා. එනම් ගර්භනීභාවයේ සිටීමේදී සිදුවන සියදිවි නසාගැනීම්.

"ගර්භනීභාවයේ සිටින මව්වරු එලෙස සියදිවි නසාගන්නේ ඇයි?" කියන කාරණාව පිළිබඳව වගකීමකින් යුතුව සොයා බැලිය යුතුය. පසුගිය වසරේ රක්තපාතය නිසා සිදුවුනු මාතෘ මරණ සංඛ්‍යාවට සමාන මරණ සංඛ්‍යාවක් සියදිවි නසා ගැනීම් සිදුවී ඇති බව වාර්තාවී තිබෙනවා.

**හෘදයාබාධ, අනාරක්ෂිත ගබ්සාවන් සහ සියදිවි නසාගැනීම නිසා ගර්භනී මව්වරුන් මියයාම පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුයි.**

කිසියම් සෞඛ්‍යමය හේතුවක් නිසා, අධික රුධිරවහණය නිසා මරණයක් සිදුවීමට කළ යුත්තේ වෛද්‍ය ප්‍රතිකර්මයක් නිසි ලෙස ලබාදීමයි.

එහෙත් සියදිවි නසාගැනීම වැනි තත්ත්ව මීට වෙනස්. මෙවැනි මරණ වළක්වාගත හැකි තත්ත්වයේ ඒවා ලෙස සැලකිය හැකිය. එනම් දැනුම-අධ්‍යාපනය ආදී නිවැරදි මග පෙන්වීමත් වෛද්‍යමය නොවන දයකත්වයන්, බලපෑම් මෙහිදී ඉතා වැදගත්. FPA ශ්‍රී ලංකා ආයතනයට මේ සඳහා විශාල වගකීමක් පැවරී තිබෙනවා. විවිධ ආර්ථික හේතු, පවුල් ගැටලු සමාජ බලපෑම් මෙවැනි මරණ වලට හේතුවිය හැකිය.

හොඳ "පවුලක්" ගොඩනගාගත හැකිවන්නේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් තොරව, අන්‍යෝන්‍ය ගෞරවයෙන් යුතුව කටයුතු කිරීමෙනි. තමන්ගේ දියුණුව, පවුලේ දියුණුව ගැන හිතන්න පුළුවන් වන්නේ එවිටයි.

තමන්ගේ ආගමික, ආධ්‍යාත්මික බලපෑම් සහ සමාජයේ අනවශ්‍ය දේ පවුල තුළට ඇතුල් කර නොගැනීමටද විශේෂයෙන් මතක තබා ගත යුතුය.

**සාකච්ඡාවක් ඇසුරෙන් සකස් කරන ලදි.**

# LiSa 2010 ව්‍යාපෘතිය

## නැවත පදිංචිකිරීම් සිදුකරන කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස 08 කට සේවා

**ගැබිණි මව්වරුන්ට සායන** | **සනීපාරක්ෂක කට්ටල බෙදුදීම** | **JOICFP පාපැදි බෙදුදීම**



ඡායාරූපය 1



ඡායාරූපය 2

ඡායාරූපය 1

ජපානයේ **JOICFP** නියෝජිතවරිය විසින් සෞඛ්‍ය සේවිකාවකට පා පැදියක් ප්‍රදානය කරන අවස්ථාව... උතුරු ආණ්ඩුකාර මේජර් ජනරාල් ජගත් චන්ද්‍රසිරි මහතා සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ශ්‍රී ලංකා නියෝජිත ලිනේ ක්‍රිස්ටියන්සෙන් මහත්මියද මෙහි වෙති.

ඡායාරූපය 2

**FPA** ශ්‍රී ලංකා හිටුපු සභාපති මේජර් ෂර්ලි සිල්වා මහතා සෞඛ්‍ය සේවිකාවකට පා පැදියක් ප්‍රදානය කරන අවස්ථාව...

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල ( UNFPA ) අනුග්‍රහයෙන් හා පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ උපදේශකත්වය යටතේ FPA ශ්‍රී ලංකා ආයතනය මගින් උතුරු පළාතේ අවතැන්වූ පුද්ගලයින් සඳහා ක්‍රියාත්මක කරනු ලබන ලීසා 2010 ව්‍යාපෘතියේ සායනික සේවාවන්, අවතැන්වූවන් නැවත පදිංචි කරනු ලබන කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්ක වෙත මේ වනවිට තවදුරටත් ව්‍යාප්තකර තිබේ.

මේ යටතේ කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස 5ක් සඳහාද මුලතිව් දිස්ත්‍රික්කයේ මල්ලාවි, ඔඩ්ඩුසුඩාන් හා මුලතිව් යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය ද ආවරණය කරමින් සේවා ලබාදේ.

විශේෂයෙන්ම ගර්භනී මව්වරුන් සඳහා ජංගම වෛද්‍ය සායන, වයස අවුරුදු 15-49ත් දක්වා සෑම කාන්තාවක් සඳහාම සනීපාරක්ෂක කට්ටල (Hygine Pack) ලබාදීම, සෑම ගර්භනී මවක් සඳහාම දරු ප්‍රසූතියෙන් පසු මවට හා දරුවාට ප්‍රයෝජනවත් වන ද්‍රව්‍ය හා උපකරණ අඩංගු කට්ටලයක්ද (Maternity Kits) ලබාදීම, මෙහිදී සිදුකෙරේ.

මීට අමතරව කිලිනොච්චි, මුලතිව් සහ මල්ලාවි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසවල සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සහ ස්වෙච්ඡා සේවකයින් සඳහා ජපානයේ ජොයිසෙෆ් (JOICFP) අනුග්‍රහයෙන් පාපැදි බෙදා දීමද සිදු කරන ලදි. වව්නියාව, සෙට්ටිකුලම කඳවුර සඳහා මෙතෙක් සිදුකළ කටයුතු එලෙසම සිදුවන අතර, එම කඳවුරේ සිටින පිරිස සඳහා ප්‍රජනක සෞඛ්‍ය උපදේශන සේවා ලබාදීමද සිදුකෙරේ. ජංගම වෛද්‍ය සායන රථ 4ක්ද, කාර්ය මණ්ඩලය තිස්දෙනෙකු පමණද මෙම කටයුතු සඳහා එක්වේ.









### විශ්ව විද්‍යාල සිසු සිසුවියන් දැනුවත් කරමින් . . . .



කොළඹ විශ්ව විද්‍යාලයේ තරුණ තරුණියන් පිරිසක් සඳහා **තොරතුරු මධ්‍යස්ථානය** මගින් සංවිධානය කළ වැඩසටහනක අවස්ථාවක් . . . .

# 2010 - 2012 ජාතික මණ්ඩලය

FPA ශ්‍රී ලංකා අයතනයේ 2010 - 2012 වර්ෂය සඳහා තෝරාපත් කරගනු ලැබූ නිලධාරීන් සහ ජාතික මණ්ඩලයේ සාමාජික සමාජිකාවන්



**ඉදිරි පෙළ වමේ සිට:** නිමල් වීරසේකර මහතා (ගරු උප සභාපති), සී. ධර්මදාස මිය (සභාපති - අලෙවි කමිටුව), වෛද්‍ය එස්ටර් අමරසේකර මිය (සභාපති - තොරතුරු අධ්‍යාපන සන්නිවේදන කමිටුව), ඉස්මෙත් ඉසදීන් මහතා (ගරු භාණ්ඩාගාරික), පද්මා කුමාරනතුංග මිය (ගරු හිටපු සභාපති), ගාමිණී වනසේකර මහතා (විධායක අධ්‍යක්ෂක), වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මිය (ගරු සභාපති), කමණී ජිනදාස මිය (ගරු ලේකම්), වෛද්‍ය අතුල කළුආරච්චි මහතා (ගරු වෛද්‍ය අධ්‍යක්ෂ), අයන්ති සමරසිංහ මිය (සභාපති - මූල්‍ය කමිටුව), සාරා සොයිසා මෙනවිය (සභාපති - තරුණ කමිටුව)

**පසු පෙළ වමේ සිට:** නලින් ආටිගල මහතා (ගරු සහකාර භාණ්ඩාගාරික), ලක්ෂ්මි රණසිංහ මිය, වෛද්‍ය ශ්‍රියානි බස්නායක මිය, සී. නිකොලෙයි මිය, එච්. බී. ක්‍රිස්තුමානි මහතා, වෛද්‍ය මාලින් අබේවර්ධන මිය, පබා දේශප්‍රිය මෙනවි ය, අනුරාධි ලියනපතිරණ මෙනවිය, ඩී. චන්ද්‍රරත්න මෙනවිය

**ඡායාරූපයේ නොමැත:** අරුණි අකුරැටියේගම මිය (ගරු සහකාර ලේකම්), එම්. කාමිල් මොහමඩ් මහතා,

## වතුකරයේ ප්‍රජාව සඳහා

## පුරුෂ සහභාගීත්වය වර්ධනයට වැඩසටහන් . . .

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය හා වැවිලි මානව සංවර්ධන භාරය ඒකාබද්ධව 2010 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලබන පුරුෂ සහභාගීත්වය වර්ධනය කරීම හා තරුණ දයකත්ව ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහන යටතේ මෙම වසරේ මැයි සිට අගෝස්තු මාසය දක්වා කාලය තුළ මහනුවර, බදුල්ල, ගාල්ල හා රත්නපුර යන වැවිලි මානව සංවර්ධන භාරයේ කලාපවල වතු සේවක සේවිකාවන් හා තරුණ කණ්ඩායම් සඳහා පුහුණු වැඩ සටහන්, ප්‍රජනක සෞඛ්‍ය හා ලිංගාශ්‍රිත රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්, ස්වේච්ඡා සේවක පුනරීක්ෂණ වැඩ සටහන් හා ජංගම සෞඛ්‍ය සායන පැවැත්වීම තුළින් 3000කට අධික සංඛ්‍යාවකට දැනුම අධ්‍යාපනය හා සේවා ලබාදී ඇත.

මෙම සෑම වැඩ සටහනක් සඳහාම අදාල කලාප භාර ප්‍රාදේශීය අධ්‍යක්ෂවරු හා සෞඛ්‍ය කාර්ය මණ්ඩලය තම පූර්ණ සහයෝගය ලබා දෙමින් අවශ්‍ය සංවිධාන කටයුතු හා නිසි සම්බන්ධීකරණයක් සැලසීම සිදුවන අතර සේවා කටයුතු ඉටු කිරීමට එය පහසුවකි. මේවනවිට සේවා ලබාගත් වතු ජනතාව අතර පුරුෂ සහභාගිත්වයේ වර්ධනයත්, කාන්තා හිංසනය අඩුවීමත්, තරුණ තරුණියන් අතර ලිංගික හිංසනය අඩුවීමත්, අඩුවයස් විවාහ කෙරෙහි යොමුවීම අඩුවීමත් මේවනවිට මෙම මාස කිහිපය තුළ පැහැදිලිව දක්නට ඇත. ව්‍යාපෘතියේ සම්බන්ධීකරණය සහකාර අධ්‍යක්ෂ සුනිල් සේනාරත්න මහතා විසින් සිදු කරනු ලබයි.





හඳුන්වාදීමේ වැඩසටහන් - මඩොල්කැලේ වතුයාය




ජංගම සෞඛ්‍ය සායනය - පිංඅරාවත්ත නමුනුකුළ

# පුවත් සංග්‍රහය

FPA SRI LANKA
enriching relationships

www.fpasrilanka.org

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07.
දුරකථන: 011 2 584 157 ෆැක්ස්: 011 2 580 915
ඊ මේල්: fpa@fpasrilanka.org

**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**

**අමතන්න 2 588 488**

**පිවිසෙන්න www.happylife.lk**

**SMS කරන්න 071 6408408**

### ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ ප්‍රතිපත්තිමය වෙනසක් ගෙනඒම සඳහා

# ඌව වෙල්ලස්සෙන් ආරම්භය

### "දැයට කිරුළ"ට සමගාමීව පැවැත්වෙන සංවර්ධන සතියේදී දත්ත ගොනුකිරීම හා දැනුවත්කරීම



FPA ශ්‍රී ලංකා අධිවාචන ඒකකයේ දුමින්ද රාජකරුණා මහතා සභාව අමතන අවස්ථාවක්, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් එම්. ජී. ඒ. තිලකරත්න මහතා ද ඡායාරූපයේ වේ.

ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ පුරෝගාමී රාජ්‍ය නොවන ආයතනය වන FPA ශ්‍රී ලංකා ආයතනය ජනතාවගේ ජීවිතවල සෞඛ්‍ය සම්පන්න භාවයත්, ජීව ගුණාත්මකභාවයත් සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් ඇතුළු වගකිවයුතු පුද්ගලයින්ගේ අවධානය යොමුකිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් මාලාවේ පළමු පියවර ඌව වෙල්ලස්ස පළාතෙන් පසුගියද ආරම්භ කරන ලදි.



**ඡායාරූපයේ වමේ සිට:** FPA ශ්‍රී ලංකා අධිවාචන ඒකකයේ මහේෂ් කුමාර මහතා, ඌව පළාත් සභාවේ සමූපකාර, නිවාස හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍ය කුමාරසිරි රත්නායක මහතා, ජනාධිපති උපදේශක ගාමිණී ජයසේකර මහතා, මොණරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත බේරුගොඩ මහතා ප්‍රදර්ශන කුටියේදී.

"2011 දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව, ඊට පූර්ව වශයෙන් පැවැත්වෙන සංවර්ධන සතිය සඳහා FPA ශ්‍රී ලංකා සහභාගීත්වය ද සිදුවිය.

සහශ්‍රක සංවර්ධන අභිමතාර්ථ 5b මඟින් පැහැදිලි කෙරෙන ආකාරයට සැමට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පහසුකම් ලබාදීම සාක්ෂාත් කරගැනීමේ කර්තව්‍ය සඳහා මෙම ප්‍රවේශයද යම් දායකත්වයක් සපයනු ඇත.

මෙම කාර්යයේදී දේශපාලන නායකත්වය, ප්‍රාදේශීය ලේකම්වරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් පූජ්‍ය පක්ෂය, විදුහල්පතිවරුන්, ගුරුභවතුන් ඇතුළු ප්‍රදේශයේ වගකිවයුතු පාර්ශවයන් තුළ මේ පිළිබඳ උනන්දුවත්, අවබෝධයත් ඇති කිරීම අප වෙත පැවරී ඇති වගකිවයුතු මෙහෙවරකි.

## අලෙවි ප්‍රවර්ධන අවස්ථාවන්...



සිනමන් ග්‍රෑන්ඩ් හොටලයේ පැවති ප්‍රදර්ශනයකදී



සියත FM සමඟ ප්‍රවර්ධන වැඩසටහනක දී



අලෙවි නියෝජිතයින් දැනුවත් කිරීම - පන්නල

## FPA ශ්‍රී ලංකා සම්පත් මධ්‍යස්ථාන

- අංක 584 B, ධර්මපාල මාවත, අම්පාර. දුරකථන: 063 4926664
- අංක 363, ත්‍රිකුණාමල පාර, මඩකලපුව. දුරකථන: 065 4923800
- අංක 79, 7 වෙනි පටුමග, නෙළුක්කුලම, මන්නාරම පාර, වව්නියාව. දුරකථන: 024 4924898

සංස්කරණය: ආනන්ද බෝධිනායක
සම්බන්ධීකරණය: අධිවාචන (Advocacy) ඒකකය
FPA ශ්‍රී ලංකා ප්‍රකාශනයකි